සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

81 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : .......................................... කෘෂි හා ආහාර තාක්ෂණය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. වැවකින් ජලය නිකුත් කිරීමේ දී බැම්මට ඇතිවන පීඩනය පාලනයට සකසා ඇති ව්‍යුහය වන්නේ
(1) සොරොව්ව (2) රළපනාව (3) බිසෝකොටුව (4) පිටවාන

02. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව
(1) 3කි (2) 7කි (3) 46කි (4) 15කි

03. **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වියලි බල්බ උෂ්ණත්වමානයේ පාඨාංක | උෂ්ණත්ව වෙනස | | | |
|---|---|---|---|---|
| | 0.5 | 1.0 | 1.5 | 2.0 |
| 30 | 96 | 93 | 89 | 85 |
| 29 | 96 | 92 | 89 | 85 |
| 28 | 96 | 92 | 88 | 85 |
| 27 | 96 | 92 | 88 | 84 |

A නම් ස්ථානයේ වියලි බල්බ උෂ්ණත්වමානයේ පාඨාංකය $29^0c$ ද තෙත් බල්බ උෂ්ණත්වමානයේ පාඨාංකය $27^0c$ නම් එම ස්ථානයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වන්නේ
(1) 78% (2) 85% (3) 92% (4) 96%

04. කාලගුණික පාරමිතීන් කීපයක් පිළිබඳ ප්‍රකාශ පහත දැක්වේ.
A සුළඟේ වේගය පැයට කිලෝමීටර වලින් ප්‍රකාශ කරයි.
B වර්ෂාපතන අගය මිලි ලීටර වලින් ප්‍රකාශ කරයි.
C ආලෝක තීව්‍රතාවය ප්‍රතිශතයක් ලෙස දක්වයි.
මෙයින් නිවැරදි වන්නේ
(1) A හා B පමණි (2) B හා C පමණි (3) A පමණි (4) C පමණි

05. සිසුවෙන් විසින් පස් නියැදියක් ගෙන තෙත් කර අත්ලේ රෝල් කරමින් මුදුවක් සාදන ලදී. ඔහු නිරීක්ෂණය කරන ලද්දේ
(1) පාංශු ව්‍යුහයකි (2) පාංශු වයනයයි (3) පාංශු ජලයයි (4) පාංශු වර්ණයයි

06. පසේ අඩංගු කාබනික කලිලයක් වන්නේ
(1) මැටි (2) වැලි (3) රොන්මඩ (4) හ්‍යුමස්

07. පස් සාම්පලයක් $105^0c$ ක උෂ්ණත්වයේ පැය 12 - 24ක් පමණ රත්කළ විට පසෙන් ඉවත්වන ජල ආකාරය, ආකාර මොනවාද?
(1) ජලාකර්ෂණ ජලය (2) කේෂාකර්ෂන හා ජලාකර්ෂණ ජලය
(3) කේෂාකර්ෂණ, ජලාකර්ෂණ ජලය (4) කේෂාකර්ෂණ ජලය

08. බෝග පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. මින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

A බඩ ඉරිඟු, කුරක්කන්, මෙනේරි ධාන්‍ය බෝග වේ.

B තල, මුං, කව්පි, මාෂ බෝග වේ.

C වැටකොළු, පතෝල, බණ්ඩක්කා, කුකර් බිටේසි කුලයේ බෝග වේ.

D බටු, මිරිස්, තක්කාලි සොලනේසි කුලයේ බෝග වේ.

(1) A සහ B පමණි (2) B සහ C පමණි (3) A සහ D පමණි (4) B සහ D පමණි

09. කරවිල, වම්බටු, බණ්ඩක්කා, මෑ යන බෝග වර්ග 4 අයත්වන කුල දැක්වෙන නිවැරදි අනුපිළිවෙළ වනුයේ

(1) ෆැබේසියේ, සොලනේසියේ, මැල්වේසියේ, කුකර්බිටේසියේ

(2) කුකර්බිටේසියේ, සොලනේසියේ, මැල්වේසියේ, ෆැබේසියේ

(3) සොලනේසියේ, මැල්වේසියේ, කුකර්බිටේසියේ, ෆැබේසියේ

(4) කුකර්බිටේසියේ, මැල්වේසියේ, සොලනේසියේ, ෆැබේසියේ

10. ශාක කුල අනුව බෝග වර්ගීකරණයේ දී සලකනු ලබන ලක්ෂණ වන්නේ

(1) බෝග අස්වනු ප්‍රමාණයයි (2) උද්භිද විද්‍යාත්මක ලක්ෂණයි

(3) ශාකයේ ජීවිත කාලයයි (4) ශාකය වැඩෙන පරිසරයයි

11. එක්තරා ශාක කුලයක පහත ලක්ෂණ දක්නට ලැබේ.

ශාක ද්විබීජ පත්‍රවේ. වැල් සහිතය. කඳෙහි අතු බෙදී ඇති අතර පහුරු සහිත වේ. මුදුන් මුල් පද්ධතියක් ඇත. පත්‍ර දාර කඩතොළු සහිත විශාල පත්‍ර ඇත. කඳෙහි සහ පත්‍රවල බොහෝ විට බූව පිහිටයි. එම ශාක අයත් කුලය වනුයේ

(1) සොලනේසියේ (2) කුකර්බිටේසියේ (3) පොඒසියේ (4) ෆැබේසියේ

12. ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණය වන්නේ

(1) තැටි නගුල, ගැමි ලී නගුල, සැහැල්ලු යකඩ නගුල

(2) තැටි නගුල, කොකු නගුල, සැහැල්ලු නගුල

(3) හැඩ ලැලි නගුල, අත්පෝරුව, බ්‍රමන පෝරුව

(4) කොකු නගුල, ජපන් පරිවර්තන නගුල, ගැමි ලී නගුල

13. බණ්ඩක්කා වගාවක් සිදු කිරීමේ දී සිටුවිය යුතු වලක ප්‍රමාණය වනුයේ

(1) 30 5 30 5 30cm (2) 60 5 60 5 60 cm

(3) 45 5 45 5 45 cm (4) 90 5 90 5 90 cm

14. ටූල් කැරියර් හා තුන්පුරුක් කල්ටිවේටරය බිම්සැකසීමේ කුමන අවස්ථාව සඳහා භාවිතා කරයි ද?

(1) ප්‍රාථමික බිම් සැකසීම (2) ද්විතියික බිම් සැකසීම

(3) අතුරුයත් ගෑම (4) ප්‍රාථමික බිම් සැකසීම හා අතුරුයත් ගෑම

15. උස් තවාන් පාත්තියක් සැකසීමේ විශේෂ පියවර අනුපිළිවෙළින් ඇති වරණය තෝරන්න.

(1) වල් පැළෑටි ඉවත්කර පස පෙරළීම, ගල් බොරලු ඉවත් කිරීම, කැට පොඩි කිරීම, ජල වහන කානු දැමීම

(2) ජලවහන කානු දැමීම, පසපෙරළීම, වල්පැළ ඉවත් කිරීම, ගල් බොරලු ඉවත් කිරීම

(3) ගල් බොරලු ඉවත් කිරීම, වල් පැළ ඉවත් කිරීම, ජල වහන කානු දැමීම, පස පෙරළීම

(4) පස පෙරළීම, ගල් බොරලු ඉවත් කිරීම, ජලවහන කානු දැමීම, කැට පොඩි කිරීම

16. නිරෝගී සාර්ථක තවාන් පැල ලබා ගැනීමට තවාන් හොඳින් නඩත්තු කල යුතු වේ. ඊට අදාළ කාර්යයක් නොවන්නේ

(1) වසුන් යෙදීම හා වසුන් ඉවත් කිරීම (2) සෙවන සැපයීම හා ජලය සැපයීම.

(3) පොහොර යෙදීම හා පැළ දැඩි කිරීම (4) කප්පාදුව හා පුහුණු කිරීම

17. පහත සටහනෙහි හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

ජලසම්පාදනය

(1) පෘෂ්ඨීය ජලසම්පාදනය (2) ............................ (3) ඉසින ජලසම්පාදනය (4) බිංදු ජලසම්පාදනය

(1) භූගත ජලසම්පාදනය (2) උපපෘෂ්ඨීය ජලසම්පාදනය

(3) ඇලිවැටි ජලසම්පාදනය (4) විසිරි ජලසම්පාදනය

18. වියලි කලාපයේ අඹ, රඹුටන්, මිදි ආදී බහුවාර්ෂික පලතුරු බෝග සඳහා සුදුසු ජලසම්පාදන ක්‍රමය වනුයේ

| | |
|---|---|
| (1) බේසම් ජලසම්පාදනය | (2) තීරු ජලසම්පාදනය |
| (3) පිටාර ජලසම්පාදනය | (4) ඉසින ජලසම්පාදනය |

19. යහපත් ජලවහනයේ වාසි බොහෝ ඇති අතර දුර්වල ජලවහනයේදී බොහෝ ගැටළු මතුවේ. එවැනි ගැටළුවක් පහත පිළිතුරු වලින් තෝරන්න.
(1) පසේ වාතනය සිදුවේ.
(2) මුල් පද්ධතිය ගැඹුරට වර්ධනය වේ.
(3) බිම් සැකසීමේ කටයුතු පහසු වේ.
(4) ශාක මුල්වල ක්‍රියාකාරිත්වයට ඔක්සිජන් නොලැබේ.

20. කාබනික පොහොරවල වැදගත්කම් කීපයක් පහත දැක්වේ. නිවැරදි වරණය තෝරන්න.
(1) පසේ කැටායන හුවමාරු ධාරිතාව අඩු කරයි. දිගු කාලයක් තිස්සේ පෝෂක නිදහස් කරයි.
(2) ගබඩා කිරීමට කුඩා ඉඩක් අවශ්‍ය වේ. ක්ෂුද්‍ර ජීවී ගහනය වැඩි කරයි.
(3) කම්කරු වියදම වැඩිය. ජල අවශෝෂණය ධාරිතාව අඩුය.
(4) පසේ $P^H$ අගය නොවෙනස්ව තබා ගනියි. සියළු පෝෂක අඩංගු වේ.

21. පසට කාබනික පොහොර යොදා පසෙහි භෞතික, රසායනික හා ජෛව ලක්ෂණ සංවර්ධනය කරගනිමින් බෝගයේ පෝෂණ අවශ්‍යතා සපිරෙන පරිදි රසායනික පොහොර යෙදීම හඳුන්වන්නේ
(1) ඒකාබද්ධ ශාක පෝෂක කලමනාකරණයයි.
(2) පසේ තෙතමනය තත්ව පරීක්ෂාවයි.
(3) පොහොර කාර්යක්ෂමතාවයයි.
(4) කැටායන හුවමාරු ධාරිතාවයි.

22. යූරියා ඇමෝනියම් සල්ෆේට් සහ රොක් පොස්පේට්වල අඩංගු N හා P ප්‍රතිශතයන් නිවැරදිව අනුපිළිවෙළින් ඇති වරණය තෝරන්න.

| | |
|---|---|
| (1) 46%, 27% - 30%, 20% | (2) 27 - 30% - 46%, 20% |
| (3) 60%, 46%, 20% | (4) 46%, 20%, 27% - 30% |

23. පූර්ණ පොහොර හා අර්ධ පොහොර ලෙස මිශ්‍රණ 2කි. වී වගාවේ මතුපිට පොහොර ලෙස යොදා ගැනෙන T.D.M හෙවත් බන්ඩි පොහොර මිශ්‍රණය කුමන වර්ගයකට අයත් වන්නේ ද?
(1) ඍජු පොහොර (2) මූලික පොහොර (3) අමිශ්‍ර පොහොර (4) අර්ධ පොහොර

24. මොනරකුඩුම්බිය, ගොඩමාරුක්, තුනැස්ස යනු පිළිවෙළින්

| | |
|---|---|
| (1) තෘණ, පන්, පළල් පත්‍ර | (2) පළල් පත්‍ර, තෘණ, පන් |
| (3) පන්, පළල් පත්‍ර, තෘණ | (4) පළල් පත්‍ර, තෘණ, |

25. යුෂ උරාබොන කෘමීන් මගින් පැතිරෙන ශාක රෝග වන්නේ,

| | |
|---|---|
| (1) වෛරස් රෝග, බැක්ටීරියා රෝග ය. | (2) දිලීර රෝග, වෛරස් රෝග ය. |
| (3) වෛරස් රෝග, ෆයිටොප්ලාස්මා රෝග ය. | (4) ෆයිටොප්ලාස්මා රෝග, දිලීර රෝග ය. |

26. හිටු මැරීම, දියමලන් කෑම හා පත්‍ර විචිත්‍රය පිළිවෙළින්
(1) දිලීර රෝගයකි, බැක්ටීරියා රෝගයකි, වෛරස් රෝගයකි.
(2) වෛරස් රෝගයකි, බැක්ටීරියා රෝගයකි, දිලීර රෝගයකි.
(3) දිලීර රෝගයකි, වෛරස් රෝගයකි, බැක්ටීරියා රෝගයකි.
(4) බැක්ටීරියා රෝගයකි, දිලීර රෝගයකි, වෛරස් රෝගයකි.

27. කුකර්බිටේසි කුලයේ පත්‍ර හා මුල්වලට හානිකරන කෘමියෙකි.
(1) එපිලැක්නා (2) අවුලකපෝරා (3) ඉල්මැස්සා (4) නෙමටෝඩා

28. පලිබෝධකයින්ගේ ස්වභාවික සතුරෙක් නො වන්නේ
(1) දිමියා (2) බත්කූරා (3) වේයා (4) මකුළුවා

29. මාස $3\frac{1}{2}$ ක වී ප්‍රභේදයක වර්ධන අවධිය කොපමණ කාලයක් ද?

(1) දින 30කි. (2) දින 40කි. (3) දින 45කි. (4) දින 50කි.

30. වී වගාවේ පරාගනය බහුලව සිදුවන කාලය වන්නේ,

(1) පැය 10.00 - 14.00 අතර කාලය (2) පැය 12.00 - 14.00 අතර කාලය
(3) පැය 10.00 - 12.00 අතර කාලය (4) පැය 8.00 - 10.00 අතර කාලය

31. වී ප්‍රභේද හඳුනා ගැනීමේ දී උපයෝගී කර ගන්නා ලක්ෂණයක් වන්නේ

(1) පුෂ්පිකා ලක්ෂණ (2) කර්ණිකා ලක්ෂණ (3) ජිහ්වල ලක්ෂණ (4) කඳෙහි ලක්ෂණ

32. සහතික කළ බිත්තර වීවල තිබිය යුතු ප්‍රරෝහණ ප්‍රතිශතය විය යුත්තේ

(1) 80% ට අඩුවය. (2) 85%කි. (3) 85%ට වැඩිය. (4) 82% ට වැඩිය.

33. අංකුර බද්ධයක් සිදු කිරීමෙන් පසු එය සාර්ථක වී ඇත්දැයි සෙවීමට බද්ධ පටි ඉවත්කර පරීක්ෂා කළ යුතු දින ගණන නම්

(1) දින 5 - 10 දී ය. (2) දින 6 - 10 දී ය. (3) දින 7 - 10 දීය. (4) දින 6 - 12 දීය.

34. මව් ශාකයකින් වෙන් කර ගන්නා ලද සක්‍රිය පටක කැබැල්ලක් අප්‍රතික තත්ත්ව හා පාලිත පරිසර තත්ත්ව යටතේ විශේෂ රෝපණ මාධ්‍යයක වගා කරමින් මව් ශාකයට සමාන නව පැළ රාශියක් නිපදවා ගැනීම.

(1) ජාන ඉංජිනේරු තාක්ෂණය වේ. (2) පටක රෝපණය නම් වේ.
(3) ජාන තාක්ෂණය නම් වේ. (4) බහු කලලතාව වේ.

35. ගොවි මහතෙකු වගාවක් ආරම්භ කිරීමට පෙර බීජ තෝරා පැය 12ක් පමණ ජලයේ පොඟවා ක්ෂේත්‍රයේ සිටුවීමට බලාපොරොත්තු වූයේ

(1) කෘමීන් වර්ධනයටය. (2) නියං ප්‍රතිරෝධීතාවයටය.
(3) බීජ ප්‍රතිකාර ක්‍රමයක් ලෙසටය. (4) රෝග කාරකයින් වර්ධනයටය.

36. අපිභෞම බීජ ප්‍රරෝහණයේදී සිදුවන්නේ,

(1) බීජයෙහි බීජධරයත් බීජෝපරියත් එකම වේගයෙන් වර්ධනය.
(2) බීජයෙහි බීජධරය වඩා වේගයෙන් බීජාංකුරය වර්ධනය වීමය.
(3) බීජයෙහි බීජාධරය බීජෝපරියට වඩා වේගයෙන් වර්ධනය වීමය.
(4) බීජයෙහි බීජෝපරිය බීජධරයට වඩා වේගයෙන් වර්ධනය වීමය.

37. නිර්පාංශු වගාවේදී පෝෂණය සැපයීම සිදුකරන විට මාධ්‍යයේ තිබිය යුතු PH පරාසය විය යුත්තේ

(1) 5.8 - 6.5 ත් අතරය (2) 6.5 - 7 ත් අතරය (3) 5.5 - 7 අතරය (4) 6 - 6.5 අතරය.

38. සරල සූර්ය ප්‍රචාරකයක් සකස් කිරීමේ දී රෝපණ මාධ්‍ය ලෙස යොදා ගනු ලබන මාධ්‍යයෙහි සංයුතිය වන්නේ

(1) වැලි : කොම්පෝස්ට් : මතුපිට පස් (1 : 1 : 1) (2) මතුපිට පස් : කොම්පෝස්ට් (1:1)
(3) වැලි : කොම්පෝස්ට් (1 : 1) (4) වැලි : කොම්පෝස්ට් : මතුපිට පස් (2 : 1 : 2)

39. හේන් ගොවිතැනෙහි කැලෑ එළිපෙහෙළි කිරීම කරනු ලබන්නේ

(1) අගෝස්තු සිට සැප්තැම්බර් දක්වාය. (2) ජූලි සිට අගෝස්තු දක්වාය.
(3) සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වාය. (4) දෙසැම්බර් සිට මාර්තු දක්වාය.

40. මූලික ඇල්බට් ද්‍රාවණය සාදා ගැනීමට භාවිතා කරන ද්‍රව්‍ය හා ප්‍රමාණවලින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) ඇල්බට් කැට (ස්පටික) 500g කට ජලය 25$l$ (2) ඇල්බට් කැට (ස්පටික) 1kg කට ජලය 25$l$
(3) ඇල්බට් කැට (ස්පටික) 1kg කට ජලය 25$l$ (4) ඇල්බට් කැට (ස්පටික) 2kg කට ජලය 25$l$

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 | S | I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ......................................... කෘෂි හා ආහාර තාක්ෂණය - II කාලය : පැය 02යි.

**I පළමු ප්‍රශ්නය හා තෝරාගත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

01. ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබේ. පවුලේ ආහාර සුරක්ෂිතතාව වැඩි කිරීමට ගෙවතු සඳහා වැඩි අවධානයක් යොමුකර ඇත.

  (i) ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන සාධක 2ක් ලියන්න.
  (ii) වී වගාව ප්‍රචලිත කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 2ක් ඉදිරිපත් කරන්න.
  (iii) ආම්ලික පස් ඇති ගෙවත්තක බෝග වගා කිරීමේ දී ගැටළු ඇතිවේ. එම ගැටළු මග හැරවීමට පසට යොදන ද්‍රව්‍ය 2ක් ලියන්න.
  (iv) වියළි කලාපයේ ගෙවතුවල භාවිතාවන සූක්ෂම ජල සම්පාදන ක්‍රම 2ක් නම් කරන්න.
  (v) තෙත් කලාපයේ හා වියළි කලාපයේ ගෙවතුවල බහුලව දකිය හැකි පස් කාණ්ඩ 2ක් ලියන්න.
  (vi) පොළවට නැමිය නොහැකි ශාක අත්තක් මව් ශාකයේ තිබියදීම මුල් අද්දවාගන්නා ක්‍රමය නම් කරන්න.
  (vii) බෝග වගාකර ඇති පසකින් ජලය ඉවත්වන ක්‍රම 2ක් ඉදිරිපත් කරන්න.
  (viii) ආග්නේය හා අවසාදිත පාෂාණවලට උදාහරණ 1ක බැගින් ලියන්න.
  (ix) කෘමි විකර්ෂක බෝග 2ක් ලියන්න.
  (x) ගෙවත්තක දකිය හැකි ආක්‍රමණශීලී වල්පැළෑටි 2ක් සඳහන් කරන්න.

02. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක් නැරඹීමට ගිය සිසුන් පිරිසක් විසින් එහි දී දුටු උපකරණ තුනක් පහත දක් වේ.



A B C

  (i) (a) A, B, C උපකරණ හඳුනාගන්න.
    (b) මෙම උපකරණවලින් ලබාගන්නා පරාමිතීන් සඳහන් කර ඒකක සඳහන් කරන්න.
  (ii) (a) වර්ෂාමානය ස්ථානගත කිරීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් දක්වන්න.
    (b) කාලගුණ මධ්‍යස්ථානයක දත්ත ලබාගන්නා සම්මත වේලාවන් දක්වන්න.
    (c) වගා කටයුතු වලදී කාලගුනික දත්ත වැදගත්වන ආකාර 2ක් දක්වන්න.
  (iii) (a) ආලෝක කාල සීමාවේ වෙනසට ශාක ප්‍රතිචාර දැක්වීම හඳුන්වන නම කුමක් ද?
    (b) ආලෝක කාල සීමාවේ වෙනසට ශාක දක්වන ප්‍රතිචාර අනුව ප්‍රධාන කොටස් තුනකට බෙදේ. ඒවා මොනවා ද?

03. බෝග වගාකරන ප්‍රධාන උපස්තරය පස වේ. එම නිසා වගා මාධ්‍යය ලෙස පසට සුවිශේෂී තැනක් හිමිවේ.

  (i) (a) පසෙහි ප්‍රධාන සංඝටක නම් කරන්න.
    (b) කෘෂිකාර්මික කටයුතු සඳහා මැටි අධික පසක් යෝග්‍ය නොවීමට හේතු 2ක් දක්වන්න.
    (c) මැටි පසක් වගාවට යොදා ගැනීමේදී අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.
  (ii) (b) පාංශු ඛාදන කාරක තුනක් නම් කරන්න.
    (b) පාංශු ජීවීන්ගෙන් ඇති ප්‍රයෝජන 2ක් දක්වන්න.

(iii) (a) පස මතුපිටින් ජලය ගලා යාමේ වේගය අඩු කිරීම සඳහා ගත හැකි පාංශු සංරක්ෂණ උපාය මාර්ග 2ක් දක්වන්න.

(b) පාංශු $P^H$ අගය මැනීම සඳහා පාංශු ද්‍රාවනයන් සකසා ගන්නා නිවැරදි ආකාරය දක්වන්න.

04. යම්කිසි බෝගයක් භූමියේ සංස්ථාපනය කිරීමට පෙර පස හා සම්බන්ධව සිදු කරන සියළුම ක්‍රියාකාරකම් මූලික බිම් සැකසීම යනුවෙන් හැඳින්වේ.

(i) බිම් සැකසීමේ අරමුණු 2ක් ඉදිරිපත් කරන්න. (2)

(ii) බෝග වගාව සඳහා සකසනු ලබන පාත්ති වර්ග 4ක් නම් කරන්න. (2)

(iii) ජලවහන කානු රටා 2ක් නම් කරන්න. (2)

(iv) තවාන් පාත්ති ජීවානුහරණය කරන ක්‍රම 2ක් ඉදිරිපත් කරන්න. (2)

(v) තවාන් මිශ්‍රනය සකස් කරගන්නා ආකාරය පියවර 2කින් ලියා දක්වන්න. (2)

## රචනා

05. වී වගාව ශ්‍රී ලංකාවේ පුරාණයේ පටන්ම පැවති ප්‍රධානම වගාවකි.

(i) (a) ගොයම් පැලයේ ප්‍රධාන වර්ධන අවධි 3 සඳහන් කර ඒවාට අයත් කාල සීමාව සඳහන් කරන්න. (2)

| වර්ධන අවධිය | කාල සීමාව |
|---|---|
| | |

(b) පාරම්පරික වී ප්‍රභේදයක් හා වැඩි දියුණු කළ වී ප්‍රභේදයක් වෙන් කර හඳුනාගත හැකි රූපීය ලක්ෂණ 2ක් ලියන්න. (2)

| පාරම්පරික වී ප්‍රභේද | වැඩිදියුණු කළ වී ප්‍රභේද |
|---|---|
| | |

(c) වී වගාවට හානි කරන කෘමීන් 3ක් ලියන්න. (1 1/2)

(d) මෑතකදී බඩ ඉරිඟු වගාවට විශාල හානියක් සිදුකළ "සේනා" නම් වූ පළිබෝධකයා අයත්වන රූපාන්තරන ආකාරය කුමක් ද? (1/2)

(ii) (a) බැක්ටීරියා රෝගයක් නිවැරදිව හඳුනාගැනීමට සරල ක්‍රියාකාරකමක් ලියන්න. (1)

(b) වගා බිමකට අලුතින් කෘමීන් ඇතුලත් වීම වලක්වා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග 2ක් ලියන්න. (2)

06. බෝග වගාවේදී ඉහළ ගුණාත්මයෙන් යුත් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා නිරෝගී රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම කාලීන අවශ්‍යතාවයක් වී ඇත.

(i) (a) ශාක ප්‍රචාරණය සඳහා දැනට භාවිතා කරන ප්‍රධාන ක්‍රම 02ක නම් කරන්න. (1)

(b) බීජ ප්‍රරෝහණය වීමට අවශ්‍ය බාහිර සාධක 03ක් ලියන්න. (1 1/2)

(ii) (a) ශාක ප්‍රචාරණය සඳහා යොදාගත හැකි භූගත කඳන් වර්ග 4ක් නම් කරන්න. (2)

(b) වර්ධක ප්‍රචාරයේ ඇති වාසි 04ක් ලියන්න. (2)

(iii) (a) බීජ අක්‍රීයතාව යනු කුමක්දැයි හඳුන්වන්න. (1)

(b) අඹ ශාකයක් බද්ධ කිරීමට සුදුසු බද්ධ ක්‍රමයක් නම් කර, රූප සටහනකින් ඇඳ කොටස් නම් කරන්න. (නම් කිරීමට 1/2, රූප සටහනට 2)

07. සාර්ථක බෝග වගාවක් සඳහා එම බෝගවලට අවශ්‍ය වායව පරසරය හා පාංශු පරිසරය ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ.

(i) (a) පාලිත තත්ත්ව යටතේ බෝග වගා කිරීමේ ඇති වැදගත්කම් 04ක් ලියන්න. (2)

(b) බෝග වගාවේදී භාවිතා කරන ස්ථිර වගා ව්‍යුහ 04ක් නම් කරන්න. (2)

(ii) (a) පොලිතීන් ගෘහවල ඇති අවාසි 04ක් ලියන්න. (2)

(b) ආරක්ෂිත ගෘහතුළට කෘමීන් ඇතුළුවීම වලක්වා ගැනීමට යොදා ගත හැකි උපක්‍රම 02ක් ලියන්න. (1)

(iii) (a) නිර්පාංශු වගාවේ ඇති වාසි 04ක් ලියන්න. (2)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 S I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

### කෘෂි හා ආහාර තාක්ෂණය පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (2) | 21. | (1) | 31. | (2) |
| 2. | (2) | 12. | (1) | 22. | (4) | 32. | (3) |
| 3. | (2) | 13. | (2) | 23. | (4) | 33. | (2) |
| 4. | (3) | 14. | (3) | 24. | (2) | 34. | (2) |
| 5. | (2) | 15. | (1) | 25. | (3) | 35. | (3) |
| 6. | (4) | 16. | (4) | 26. | (4) | 36. | (3) |
| 7. | (3) | 17. | (2) | 27. | (2) | 37. | (1) |
| 8. | (3) | 18. | (1) | 28. | (3) | 38. | (1) |
| 9. | (2) | 19. | (4) | 29. | (3) | 39. | (2) |
| 10. | (2) | 20. | (4) | 30. | (1) | 40. | (4) |

### II පත්‍රය

01. (i) 1. ආහාර සුලබවීම (ල. 1/2 5 3 = 1/12)
2. ප්‍රවේශ වීමේ හැකියාව
3. ප්‍රයෝජනයට ගැනීම

(ii) 1. පොහොර සහනාධාර
2. වැඩිදියුණු කළ ප්‍රභේද ලබාදීම
3. වී සඳහා සහතික මිලක් තිබීම

(iii) 1. ඩොලමයිට් 2. දිය ගැසූ හුණු
3. පිලිස්සූ හුණු

(iv) 1. බිංදු ජල සම්පාදනය
2. විසිරි ජල සම්පාදනය

(v) 1. රතු දුඹුරු පස
2. රතු කහ පොඩ්සොලික් පස (2)

(vi) වායව ලේයර් ක්‍රමය

(vii) උත්ස්වේදනය, වාෂ්පීකරණය, ගැඹුරු වැස්සීම

(viii) ආග්නේය - ක්වාට්ස්, ග්‍රැනයිට්, පෙග්මටයිට්

(ix) 1. දාස්පෙතියා 2. සූරියකාන්ත 3. කොහොඹ
4. කරඳ 5. කොහොඹ

(x) 1. ගඳපාන 2. පිලිෆයින් අයර්වර්ක්ස්
3. විඩේලියා 4. පාතිනියම්

### II කොටස

02. (i) (a) 1. උපරිම හා අවම උෂ්ණත්වමානය
2. සූර්ය විකිරණ මානය
3. තෙත් හා වියලි බල්බ උෂ්ණත්වමානය

(b) උෂ්ණත්වය - $^{0}C$ හා $^{0}F$
ආලෝක තිව්‍රතාවය - ලක්ස්
සාපේක්ෂ ආර්ද්‍රතාවය - ප්‍රතිශතයක් ලෙස

(ii) (a) 1. පොළව මට්ටමේ සිට ඉහළ ධාරයට 30cm ක් උස තිබිය යුතුය.
2. බාහිර බාධකවල උසමෙන් දෙගුණයක් ඈතින් සවිකළ යුතුය.
3. සමතලා භූමියක ස්ථාපනය කළ යුතුය.
4. වර්ෂාමානයේ ජලය කාන්දු වේදැයි බැලිය යුතුය. ලකුණු 1/2 5 2 = 1

(b) උදේ 8.30
සවස 3.30 ලකුණු 1/2 5 2 = 1

(c) 1. වගා කරන බෝගය තෝරා ගැනීමට
2. වගා කාල සීමාව තීරණයට
3. බෝගයක වාරි ජල අවශ්‍යතාව තීරණයට
ලකුණු 1/2 5 2 = 1

(iii) (a) ප්‍රකාශවර්තීතාව ලකුණු 1

(b) දිගු දින ශාක, කෙටි දින ශාක
දින උදාසීන ශාක ලකුණු 1/2 5 3 = 1 1/2

03. (i) (a) පාංශු ඛනිජ
පාංශු වාතය
පාංශු ජලය
පාංශු කාබනික ද්‍රව්‍ය
පාංශු ජීවීන් ලකුණු 1/2 5 4 = 2

(b) 1. පාංශු වාතනය දුර්වලවීම
2. පාංශු ජල වහනය දුර්වලවීම

3. තෙත් වූ විට ඇලෙනසුලු වීම
4. වියළි වීම තද ස්වභාවයක් ගැනීම
ලකුණු 1/2 5 2 = 1

(c) 1. නිතර නිතර පස පෙරළීම
2. හැකි පමණ කාබනික ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
3. වැලි මිශ්‍ර කිරීම
ලකුණු 1/2 5 2 = 1

(ii) (a) 1. ගලායන ජලය
2. සුළඟ
3. මුහුදු රළ
4. මිනිස් හා සත්ත්ව ක්‍රියාකාරකම්, ග්ලැසියර
ලකුණු 1/2 5 3 = 1 1/2

(b) 1. කාබනික ද්‍රව්‍ය ජීරණය කිරීම
2. පස බුරුල් කිරීම
3. පසේ වාතනය දියුණු කිරීම
4. නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය කිරීම
5. පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීම

(iii) (a) 1. සමෝච්ඡ පස් වැටි දැමීම
(සමෝච්ඡ යන්න අනිවාර්ය වේ.)
2. හෙල්මළු සැකසීම
3. සමෝච්ඡ කානු කැපීම
4. සමෝච්ඡ රේඛා අනුව සී සෑම
5. පසට වසුන් යෙදීම
6. ආවරණ බෝග වගාව
ලකුණු 1 5 2 = 2

(b) පස් හා ආස්‍රැත ජලය 1:6 අනුපාතයට ගෙන මිශ්‍රකර පස් අංශු තැන්පත් වනතුරු නිශ්චලව තබා ලැබෙන කඩදාසිය දමා මැනිය හැකිය. ලකුණු 1 1/2 මුළු ලකුණු 10

04. (i) පසේ භෞතික තත්ත්වය දියුණුකිරීම
පසට පොහොර මිශ්‍රනය
පලිබෝධ පාලනය
ගල් බොරළු ඉවත් කිරීම

(ii) උස් පාත්ති, ලියදි පාත්ති
තනි වගා වලවල්, වැටි හා කාණු

(iii) උළු කානු, ගල් කානු/ලී කානු,
කොඩොල් කානු

(iv) සූර්ය තාපය, පිලිස්සීම, උණු ජලය, රසායනික ද්‍රව්‍ය

(v) මතුපිට පස් හා කොම්පෝස්ට් සල්ලඩයකින් හලා 1:1 අනුපාතයකින් මිශ්‍ර කිරීම

05. (i) (a)

| වර්ධන අවධිය | කාල සීමාව |
|---|---|
| 1. වර්ධක අවධිය | බෝගයේ වයස අනුව වෙනස් වේ. |
| 2. ප්‍රජනන අවධිය | දින 30 |
| 3. මේරීමේ අවධිය | දින 30 |

(b)

| පාරම්පරික වී | වැඩි දියුණු කළ වී |
|---|---|
| 1. ශාකය උසින් වැඩිය | 1. ශාකය මිටිය |
| 2. පත්‍ර සිහින්ය දිගටියසාපේක්ෂ තිරස්ව පිහිටයි | 2. පත්‍ර කෙටිය, පළල්ය. සිරස්ව පිහිටයි. |

(c) 1. ගොයම් මැස්සා, මකුණා
2. පැල මැක්කා
3. කීඩෑවා
4. පුරුක් පණුවා ල. 1/2 5 3 = 1 1/2

(d) පූර්ණ රූපාන්තරණය ල. 1/2

(ii) (a) ආසාදිත ශාක කොටස කපා ජල බඳුනක ගිල්වූ විට බැක්ටීරියා යුෂය ජලයට වැස්සෙනු දැකිය හැකිය.

(b) 1. පිරිසිදු රෝපණ ද්‍රව්‍ය භාවිතය
2. රෝපන ද්‍රව්‍ය සිටුවීමට පෙර ප්‍රතිකාර කිරීම
3. පළිබෝධ බිත්තරවලින් තොර කාබනික පොහොර යෙදීම
4. විකර්ශක උපක්‍රම යෙදීම
5. ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම
6. ආරක්ෂිත ගෘහ තුළ වගාව
7. සමතුලිත පෝෂණය සැපයීම (2)

06. (i) (a) ලිංගික ප්‍රචාරණය, අලිංගික ප්‍රචාරණය
වර්ධක ප්‍රචාරණය ල. 01

(b) ජලය (තෙතමනය), වාතය (ඔක්සිජන්)
ප්‍රශස්ථ උෂ්ණත්වය ල. 1 1/2

(ii) (a) රෛසෝම, කෝම, බල්බ, ස්කන්ධ ආකන්ධ
ල. 02

(b) මව් ශාකයට සමාන පැල ලබා ගැනීම, ක්ෂේත්‍රයේ ඒකාකාරී වගාවක් ලබා ගැනීම, ක්ෂේත්‍ර කටයුතු පහසුවීම, බීජ නොනිපදවන ශාක ප්‍රචාරණයට යොදා ගත හැකිවීම, බීජ ප්‍රරෝහණය කර ගැනීමට අපහසු ශාක ප්‍රචාරණයට යොදා ගත හැකිවීම, බීජ ප්‍රරෝහණය කර ගැනීමට අපහසු ශාක ප්‍රචාරණයට යොදා ගත හැකිවීම, මව් ශාකයේ ලක්ෂණ නොවෙනස්ව ඉදිරියට පවත්වාගෙන යාමට හැකිවීම.
වර්ධක ප්‍රචාරණ පැල ප්‍රමාණයෙන් කුඩා හා උසින් අඩු බැවින් කප්පාදු කිරීම, අස්වනු නෙළීම් ආදී නඩත්තු කටයුතු පහසු වීම.
වල දැමීමට ගතවන කාලය අඩුකිරීම

(iii) (a) ජීවී බීජයකට ප්‍රරෝහණය වීමට අවශ්‍යය සාධක ලැබී තිබියදීත් එය ප්‍රරෝහණය නොවී තිබීම වේ.

මෙහි ජීවී බීජයක් යන වචනය පමණක් ඇත්නම් පමණක් ලකුණු ලබා දෙන්න. (ල. 01)

(b) පැලුම් රිකිලි බද්ධය, පැච් (පැලැස්තර) බද්ධය, නිවැරදිව ඇඳ ඇති රූපසටහනකට ලකුණු ලබා දෙන්න. නම් කිරීමට 1/2 රූප සටහනට 2)

07. (i) (a) බෝගයට අවශ්‍ය පරිසර සාධක ප්‍රශස්ථව ලබාදෙන බැවින් වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.
පරිසර සාධක ප්‍රශස්තවීමට අමතරව පළිබෝධ හානි අවම වන බැවින් අස්වනුවල ගුණාත්මක බව වැඩි වේ.
පාලිත තත්ත්ව යටතේ වගා කිරීමෙන් අධාරයේ අස්වනු ලබාගත හැකිය.
කාලගුණික සාධක බෝගයකට නොගැළපෙන අවස්ථාවලදී වුවද බෝගවගා කළ හැකිවීම.
ශාක ප්‍රචාරණයේ දී පත්‍ර, මුල්, ආදී කැබලිවල මුල් ඇදීම උත්තේජනය කිරීම සඳහා පටක රෝපණයෙන් ලබා ගන්නා බාහිර පරිසරයට අනුවර්තනය කර ගැනීමට විවෘත පරිසර තත්ත්ව යටතේ වගා කිරීමට අපහසු ඉහළ වටිනාකමකින් යුත් බෝග වගා කිරීමට
(ල. 02)

(b) පොලිතීන් ගෘහ, ලී පටි ගෘහ, දැල් ගෘහ, වීදුරු ගෘහ හරිතාගාර (ල. 02)

(ii) (a) සැකසීමට අධික වියදමක් යාම
තාක්ෂණික දැනුමක් අවශ්‍ය වීම
ගෘහ තුළ උෂ්ණත්වය ඉහළයාම, බෝගවලට අහිතකර වීම
උෂ්ණත්වය ඉහළ යාම නිසා උෂ්ණත්ව පාලනයට උපක්‍රම යෙදීමට අමතරව වියදමක් යාම.
ඇල්ගී වර්ග බෝවීම
නැවත නැවත පොලිතීන් ඉවත් කිරීමට සිදුවීම. (ල. 02)

(b) කෘමි ප්‍රතිරෝධ දැල් භාවිතා කිරීම දොර අක්වක් (zig zag) ආකාරයට සැකසීම (ල. 01)

(iii) (a) මනා වාතනයක් තිබීම
හොඳින් ජලවහනය සිදුවීම
ජලය රඳා ගැනීමේ හැකියාව
ස්වාරක්ෂ ගුණය පැවතීම
පළිබෝධවලින් තොරවීම (ල. 01)

(b) කුඩා ඉඩක් අවශ්‍ය වීම
බිම් සැකසීම, ජල සම්පාදනය, වල් මර්ධනය අවශ්‍ය නොවීම
නොකඩවා වගාව පවත්වා ගැනීම
පාංශු ක්ෂුද්‍ර ජීවීන් නිසා රෝග බෝවීමක් නොමැති වීම
කම්කරු අවශ්‍යතා අඩුවීම
අහිතකර පාංශු තත්ත්වවලට ලක් නොවීම
අස්වැන්න ගුණාත්මක වීම
අවාරයේ වුවද අස්වනු ලබාගත හැකිවීම
(ල. 02)